# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

**අංක 11,731—1959 අප්‍රේල් 27 වැනි සඳුද—27.4.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඝ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ජේදය—සාමාන්‍ය

## මිළ පාලන දන්වීම්

**ආර්/19/1959 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය.**

**1950හේ අංක 29 දරණ මිළ පාලන පනත** **සුදු සීනි**

**නියෝගය**

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් හේවා ඩනී වීරරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1956 මැයි මස 18 වෙනි දින අංක 10,930 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1956 මැයි මස 8 වෙනි දින අංක ආර්/10/1956 දරණ ආහාර මිළ නියෝගයේ සඳහන් සුදු සීනි පිළිබඳව තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළද මෙම නියෝගයෙන් අද දින සිට අවලංගු කරමි.

(2) සුදු සීනි තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද සිල්ලර වශයෙන් විකිණීමේදී බර රාත්තලක් ද, මේ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දන් පටන් මෙහිම 2 වෙනි, 3 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) එසේම යම් ස්ථානයක හෝ වාහනයක සුදු සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(4) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරන ලද සෑම ප්‍රදේශයකම සුදු සීනි වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතුබව නියම කරමි.

(5) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා.'' යනුවෙන් සළකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(6) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සුදු සීනි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සීනි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සුදු සීනි ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ සුදු සීනි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(7) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සුදු සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට සුදු සීනි දළ බර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ආ) සුදු සීනි පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ඇ) ''සුදු සීනි'' යන්නෙන් සියලුම හකුරු වර්ග අත්හැර සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

1119—ජේ. ඇන්. ආර් 1527—4,200 (4/59)

(8) සුදු සීනි විකුණනවිට එය යම්කිසි දෙයක ඔතා හෝ බහා දෙන දේයක් වෙතොත් එහි මිළත් උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත්වී ඇති බවද නියම කරමි.

1959 අප්‍රියෙල් මස 20 වෙනි දින පස්වරු 5ට රත්නපුර කච්චේරියේදී අත්සන් තබන ලදී.

එච්. ඩී. වීරරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

## උපලේඛනය

| 1වෙනි තීරය<br>ප්‍රදේශය | 2වෙනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ (සුදු සීනි)<br>රු. ශ. | | 3වෙනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ (සුදු සීනි)<br>රු. ශ. |
|---|---|---|---|
| (1) (අ) රත්නපුර පළාත් ආණ්ඩු සහා ප්‍රදේශය ... ... ...<br>(ආ) ගවරගිරිය වසම හැර කුකුළු කෝරලේ පල්ලේ පත්තුව ... ...<br>(ඇ) එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදැනී වසම් හැර කුරුවිටි කෝරලේ උඩ පත්තුව සහ කරඳන සහ කලටුවාව නැගෙනහිර යන ගම්මුලාදැනි වසම් | 67 0 | ... | 0 62 |
| (2) කලටුවාව නැගෙනහිර ගම්මුලාදැනි වසම හැර කුරුවිටී කෝරලේ පල්ලේ පත්තුව සහ කරඳන ගම්මුලාදැනි වසම හැර කුරුවිටි කෝරළේ මැද පත්තුව | 67 0 | ... | 0 62 |
| (3) (අ) නවදුන් කෝරලේ උඩ පත්තුව, මැද පත්තුව, සහ පල්ලේ පත්තුව ...<br>(ආ) කුකුළු කෝරලේ මැද පත්තුව ... ... ... | 67 50 | ... | 0 63 |
| (4) (අ) බලන්ගොඩ පළාත් ආණ්ඩු සහා ප්‍රදේශය ... ...<br>(ආ) රක්වාන සුළු නගර සහා ප්‍රදේශය ... ... ...<br>(ඇ) කුරුවිටි කෝරලේ එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ, සහ කුඩාව යන ගම්මුලාදැනි වසම් ... ... ... ...<br>(ඈ) කල්තොට වසම හැර කඩවත මැද කෝරලේ හෙල පල්ලේ පළාත, හෙලඋඩ පළාත, සහ උඩුවග්ගම් පත්තුව ... ... ... ...<br>(ඉ) අටකලං කෝරලේ පන්නිල් පත්තුව, මැද පත්තුව සහ පල්ලේ බැද්ද ගම්මුලාදැනි වසම<br>(ඊ) කුකුළු කෝරලේ උඩ පත්තුව සහ ගවරගිරිය ගම්මුලාදැනි වසම ... | 67 25 | ... | 0 63 |
| (5) (අ) කොළොන්නා කෝරලේ කොළොන්නාගම් පත්තුව සහ දියපොට ගම් පත්තුව<br>(ආ) කඩවත කෝරලේ තල්පිටිගම් පත්තුව ... ... ...<br>(ඇ) අටකලංකෝරලේ පල්ලේ බැද්ද ගම්මුලාදැනි වසම හැර දෙපත්තුව ...<br>(ඈ) මැද කෝරලේ කල්තොට වසම ... ... ... | 67 50 | ... | 0 63 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

**ආර්/18/1959 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය.**

## 1950හේ අංක 29 දරණ මිළ පාලන පනත

**දුඹුරු සීනි**

### නියෝගය

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් හේවා ඩැනී වීරරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1956 මැයි මස 4 වෙනි දින අංක 10,925 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරන ලද 1956 අප්‍රේල් මස 30 වෙනි දින දරණ ආහාර මිළ නියෝගයේ දුඹුරු සීනි පිළිබඳව තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළද මෙම නියෝගයෙන් අද දින සිට අවලංගු කරමි.

(2) දුඹුරු සීනි තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වශයෙන් විකිණීමේදී බර රාත්තලක්ද මේ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දූන් පටන් මෙහිම 2 වෙනි, 3 වෙනි තීරයන්හි පිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) එසේම යම් ස්ථානයක හෝ යම් වාහනයක දුඹුරු සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(4) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම දුඹුරු සීනි වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද නියම කරමි.

(5) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යනුවෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(6) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම දුඹුරු සීනි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා දුඹුරු සීනි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ දුඹුරු සීනි ප්‍රමාණය (බර අනුවයි),

(ඇ) විකුණූ දුඹුරු සීනි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල, සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(7) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) දුඹුරු සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට දුඹුරු සීනි දළ බර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අඳමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ආ) දුඹුරු සීනි පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්;

(ඇ) '' දුඹුරු සීනි '' යන්නෙන් සියලුම හකුරු වර්ග අත්හැර සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(8) දුඹුරු සීනි විකුණන විට එය යම්කිසි දෙයක බහා හෝ ඔතා දෙන දෙයක් වෙතොත් එහි මිළත් උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුලත් වී ඇති බවද නියම කරමි.

1959 අප්‍රේල් මස 20 වෙනි දින පස්වරු 5 ට රත්නපුර කච්චේරියේදී අත්සන් තබන ලදී.

එච්. ඩී. වීරරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

## උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| ප්‍රදේශය | තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ (දුඹුරු සීනි) රු. ශ. | සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ (දුඹුරු සීනි) රු. ශ. |
| (1) (අ) රත්නපුර පලාත් ආණ්ඩු සභා ප්‍රදේශය (ආ) ගවරගිරිය වසම හැර කුකුළු කෝරලේ පල්ලේ පත්තුව, (ඇ) එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදැනි වසම හැර කුරුවිටි කෝරලේ උඩ පත්තුව සහ කරඳන සහ කලටුවාව නැගෙනහිර යන ගම්මුලාදැනි වසම් | 59 75 | 0 55 |
| (2) කලටුවාව නැගෙනහිර ගම්මුලාදැනි වසම් හැර කුරුවිටි කෝරලේ පල්ලේ පත්තුව සහ කරඳන ගම්මුලාදැනි වසම හැර කුරුවිටි කෝරලේ මැද පත්තුව ... ... | 59 50 | 0 55 |
| (3) (අ) නවදුන් කෝරලේ උඩ පත්තුව, මැද පත්තුව, සහ පල්ලේ පත්තුව (ආ) කුකුළු කෝරලේ මැද පත්තුව ... ... ... ... | 60 25 | 0 56 |
| (4) (අ) බලන්ගොඩ පලාත් ආණ්ඩු සභා ප්‍රදේශය, (ආ) රක්වාන සුළු නගර සභා ප්‍රදේශය, (ඇ) කුරුවිටි කෝරලේ එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදැනි වසම්, (ඈ) කල්තොට වසම හැර කඩවත මැද කෝරලේ හෙල පල්ලේ පලාත, හෙල උඩ පලාත සහ උඩුවගම පත්තුව, (ඉ) අටකලං කෝරලේ පන්නිල් පත්තුව, මැද පත්තුව සහ පල්ලේබැද්ද ගම්මුලාදැනි වසම, (ඊ) කුකුළු කෝරලේ උඩ පත්තුව සහ ගවරගිරිය ගම්මුලාදැනි වසම ... | 60 0 | 0 56 |
| (5) (අ) කොළොන්නා කෝරලේ කොළොන්නාගම පත්තුව සහ දියපොටගම පත්තුව, (ආ) කඩවත කෝරලේ තල්පිටිගම පත්තුව, (ඇ) අටකලං කෝරලේ පල්ලේ බැද්ද ගම්මුලාදැනි වසම හැර දෙපත්තුව, (ඈ) මැද කෝරලේ කල්තොට වසම ... ... ... | 60 25 | 0 56 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි වැඩිම මිළ වේ. **එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.**